**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල - 2017**

-----------------------------------------------------------------

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන සේවා ආඥා පනතේ (264 අධිකාරිය) 62 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 අභිතකර මතය

---------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

අරමුදල විසින් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කරන බැවින් ඒ අනුව උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවද, ආදායම උපචිත පදනම මත ද වියදම මුදල් පදනම මත ද ගිණුම්ගත කර තිබුණි. මේ අනුව, අරමුදල වෙත ලැබෙන සම්පූර්ණ දායක ලැබීම් වියදමක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් අඛණ්ඩව මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් ඇති වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී පමණක් එය පිළිවෙලින් රු.36,428,661 ක් හා රු.64,985,626 ක් වී තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේ රු.1,421,320,802 ක් වූ සමුච්චිත අරමුදලේ ශේෂයද සමාලෝචිත වර්ෂයේදී රු.1,382,039,109 ක් දක්වා හීන වී තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

---------------------------------------------------------------------------

2012 පෙබරවාරි 08 දිනැති අංක 01/2012 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල විසින් ඒ ඒ මාසයේ මියගිය සාමාජිකයන්ගේ විස්තර පිළිබඳ වාර්තා ඊළග මාසයේ 25 දිනට පෙර දිස්ත්‍රික් ලේකම්වරුන් මඟින් ගෙන්වාගෙන එම වාර්තා අනුව මියගිය සාමාජිකයන්ගේ තොරතුරු යාවත්කාලීන කර නොතිබුණි.

### 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ හිටි දායක මුදල්වල වටිනාකම පළාත් පාලන ආයතන 292 කට අදාලව එකතුව රු. 1,317,604,316 ක් වූ අතර එයින් රු. 100,000 ට වඩා වැඩි හිඟ හිටි දායක මුදල් සහිත පළාත් පාලන ආයතන සංඛ්‍යාව 184 ක් වූ අතර එහි දායක මුදල් වටිනාකම රු. 1,314,808,618 ක් විය. මෙයින් රු.මිලියන 100 ට වැඩි හිඟ හිටි පළාත් පාලන ආයතන සංඛ්‍යාව 03 ක් හා එහි වටිනාකම රු. 558,549,276 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී දායක මුදල් කිසිවක් ගෙවා නොමැති පළාත් පාලන ආයතන සංඛ්‍යාව 96 ක් වූ අතර එම ආයතනයන්ගෙන් අයවිය යුතු දායක මුදල රු. 475,638,177 ක් අයකර ගෙන නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂ 05 ක කාලයක සිටම අයවීම් හිඟ හිටව පැවති පළාත් පාලන ආයතන 61 කින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු දායක මුදල රු. 435,431,048 ක් වූ අතර එය සමස්ථ හිඟ දායක මුදලින් සියයට 33 ක් විය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 64,985,626 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.36,428,661 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කාර්යසාධනය

1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 15 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයන්ට විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික දීමනා ගෙවීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබුණි. එසේ වුවද 1993 වර්ෂයේ පළාත් රාජ්‍ය සේවය ස්ථාපිත වීමත් සමඟ පළාත් රාජ්‍ය නිලධාරීන් හට රාජ්‍ය නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිවීම නිසා 1993 සැප්තැම්බර් 03 දින සිට අරමුදලට නව සාමාජිකයින් එකතු වීමක් සිදු වී නොතිබුණි. එලෙස නව සාමාජික මුදල් නොලැබීම හා සිටින සාමාජිකයින්ගේ දායකය විශ්‍රාම වැටුප් ගෙවීමට තරම් ප්‍රමාණවත් නොවීම නිසා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන මඟින් විශ්‍රාම වැටුප් වියදම් දැරීමට සිදු වී තිබුණි. ඒ අනුව අරමුදල පිහිටුවීමේ මූලික අරමුණ ඉටු වී නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර තිබූ නමුත් එම අංශය මඟින් හෝ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දී අරමුදලේ කටයුතු පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබිඹු වන පරිදි නිවැරදිව ආදායම් හා වියදම් ගිණුම්ගත කර නොතිබීම. |
| (ආ) | දායක මුදල් අයකිරීම | හිඟ දායක මුදල් හා සමාලෝචිත වර්ෂයේ දායක මුදල් නිසි පරිදි අයකර ගැනීමට කටයුතු නොකිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) | පොත්පත් හා ලේඛන පැවැත්වීම | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් තොරතුරු කැඳවා සාමාජික දත්ත යාවත්කාලීන නොකිරීම හා ඒ අනුව විශ්‍රාම වැටුප් වියදම තහවුරු කර නොතිබීම. |